SAMPLE

# ලංසු ඉදිරිපත් කිරීමේ අයදුම්පත්‍රය
# දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය
## විශේෂ හා සාමාන්‍ය සේවා වාර්ෂික මගී ප්‍රවාහන බලපත්‍ර ලබා ගැනීම.

**1.** ලංසුකරු පිළිබඳ විස්තර

I. සම්පූර්ණ නම : ------------------------------------------------------------

II. ලිපිනය -: පෞද්ගලික/ කාර්යාලයීය ; ------------------------------------------------------------

------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------

III. ජාතික හැඳුනුම්පත් අංකය ; ----------------------------

IV. දුරකථන අංකය ; ---------------------------- ජංගම ; ----------------------

V. සමාගමක් හෝ වෙනත් ආයතනයක් නම් එහි ලියා පදිංචි නම ; --------------------------------

--------------------------------------------------------------------------------

VI. ලියාපදිංචි අංකය හා දිනය ; ----------------------------

**2.** දැනට අධිකාරියේ මගී ප්‍රවාහන බලපත්‍ර ලබාගෙන ඇත්නම් ඒ පිළිබඳ විස්තර

| අනු අංකය | මාර්ග අංකය | සේවාව | බලපත්‍ර අංකය | බස්රථ අංකය |
|---|---|---|---|---|
| | | | | |

## 3. ඉල්ලුම් කරන සේවාව

I. ඉල්ලුම් කරන මාර්ග අංකය ; ----------------

II. ඉල්ලුම් කරන සේවාව ; ------------------------------------------------

III. ප්‍රසිද්ධ කරන ලද ප්‍රසම්පාදන දැන්වීමේ යොමු අංකය; ------------------------------------

## 4. බලපත්‍රය සඳහා වාර්ෂිකව ගෙවීමට ඉදිරිපත් කරන ලංසුව

I. බලපත්‍රය සඳහා වාර්ෂිකව ගෙවීමට එකඟවන මුදල (අකුරෙන්) ; රු.----------------------------------------

--------------------------------------------------------------------------------

II. එම මුදල ඉලක්කමෙන් ;රු. -----------------------

**5.** ආපසු ගෙවන තැන්පතුව වශයෙන් අධිකාරියට ගෙවා ඇති මුදල ; රු. -------------------------

I. කුවිතාන්සි අංකය ; -------------------------

**6.** පවතින මාර්ග බලපත්‍රය අහෝසි කිරීම යටතේ ලංසු අයදුම් කරන අවස්ථාවක එම බලපත්‍රයට අදාල විස්තර ( ලංසු ආරාධනා 1 යටතේ ඉල්ලුම් කරන්නේ නම් )

| මාර්ග අංකය | සේවාව | බලපත්‍ර අංකය |
|---|---|---|
| | | |

ලංසු ඉදිරිපත් කිරීමේ උපදෙස්, කොන්දේසි හා අනෙකුත් සියලුම විස්තර පරික්ෂා කිරීමෙන් අනතුරුව මෙම අයදුම් පත්‍රය ඉදිරිපත් කරන අතර, එම උපදෙස්, කොන්දේසි හා සියලුම කරුණුවලට මා එකඟ වෙමි. ලංසු විවෘත කරන දිනට මම හෝ මාගේ නියෝජිතයෙකු අනිවාර්යයෙන්ම ඉදිරිපත් වන බවද දන්වා සිටිමි. එදිනට සහභාගීත්වය තහවුරු කල නොහැකි වුවහොත් මාගේ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප වන බවද මා දනිමි.

ඉල්ලුම් කරන මගී සේවා බලපත්‍රය මාහට ලැබුනහොත් දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ 1996 අංක 02 දරණ ප්‍රඥප්තිය හා 2009 අංක 01 දරණ දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සංශෝධිත ප්‍රඥප්ති ප්‍රකාරව අධිකාරියේ අනෙකුත් සියලුම නීතිරීතිවලට හා රෙගුලාසි වලට යටත්ව බස් සේවා පැවැත්වීමට පොරොන්දු වන අතර, අධිකාරියේ පුහුණුව ලැබූ සේවක කණ්ඩායම් යොදවා අනිවාර්යයෙන්ම සේවාව අඛණ්ඩව ඉටු කිරීමට පොරොන්දු වෙමි.

අයදුම් කරන වැඩිම ලංසුව හෝ ඕනෑම ලංසුවක් පිළිගැනීමට මගී ප්‍රවාහන අධිකාරිය බැඳී නොමැති බවද මා හොඳින් දනිමි.

මෙම අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කර ඇති ලංසු ඉදිරිපත් කිරීමේ උපදෙස් හා කොන්දේසි නිවැරදිව කියවා අවබෝධ කර ගෙන, එම කොන්දේසිවලට එකඟව මෙම අයදුම්පත්‍රය යොමු කරන බව ප්‍රකාශ කරන අතර මා විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

SAMPLE

දිනය: .................................... ....................................

අත්සන (ලංසුකරු)

**<u>කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.</u>**

1. ලංසු ලිපිලේඛණ ගාස්තුව : රු.----------------------------------------
2. ගෙවූ දිනය හා ලදුපත් අංකය : ----------------------------------------
3. ආපසු ගෙවන තැන්පතු මුදල : රු.----------------------------------------
4. ගෙවූ දිනය හා ලදුපත් අංකය : ----------------------------------------

තැන්පතුව ආපසු ගෙවීම

1. තැන්පතුව ආපසු ගෙවූ දිනය : ----------------------------------------
2. චෙක්පත් අංකය : ----------------------------------------
3. තැපෑලෙන් යැවුවේ නම් යැවූ දිනය හා ලේඛනගත කල අංකය :----------------------------------
4. පැමිණ ලබා ගත්තේ නම් ලබාගත් අයගේ නම හා ලිපිනය :-------------------------------------------
   ---------------------------------------------------------------------------------------------
5. හැඳුනුම්පත් අංකය : -------------------------------- නිකුත් කල දිනය --------------

**විශේෂ හා සාමාන්‍ය සේවා වාර්ෂික මගී ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීම.**
**ලංසු ඉදිරිපත් කිරීමේ උපදෙස් හා කොන්දේසි.**
**දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය**

## 01.හැඳින්වීම

**1.1** දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය, විශේෂ හා සාමාන්‍ය සේවා වාර්ෂික මගී ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීමට ධාවකයින් තෝරා ගනු ලබන්නේ, ලංසු අයදුම් පත්‍ර මගින් ඉදිරිපත් කරනු ලබන ලංසු මිල පදනම් කර ගෙනය. අධිකාරිය විසින් ලංසු සඳහා ආරාධනාවක් පිලිබඳ දැන්වීම ප්‍රසිද්ධ කල පසු, මාර්ගයක් සඳහා ලංසුකරු අධිකාරියට ගෙවීම් කිරීමට එකගවන මුදල ලංසු අයදුම් පත්‍රයේ පැහැදිලිව සඳහන් කල යුතුය. අනෙකුත් කරුණු සපුරා ඇත්නම් ඉදිරිපත් කරන ලංසුව අනුව බලපත්‍ර නිකුත් කිරීමට සුදුසු ධාවකයින් තෝරා ගනු ලැබේ.

**1.2** බලපත්‍ර නිකුත් කිරීමට සුදුසු ආයෝජකයකු තෝරා ගැනීමෙන් පසු ඔහුට හෝ ඇයට විශේෂ හෝ සාමාන්‍ය සේවා වාර්ෂික මගී ප්‍රවාහන බලපත්‍රයක් නිකුත් කරනු ලබන්නේ 1996 අංක 02 දරණ දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ප්‍රඥප්තියේ කොන්දේසි හා 2009 අංක 01 දරණ දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සංශෝධිත ප්‍රඥප්ති ප්‍රකාරව නීතිරීති, රෙගුලාසි හා නියමයන්ද ලංසු ලිපිලේඛණවල ඇතුළත් කර ඇති කොන්දේසි අනුවය.

## 02. ලංසු ඉදිරිපත් කිරීමට අවශ්‍ය සුදුසුකම්

**2.1** මගී ප්‍රවාහන ක්ෂේත්‍රයට යොමු වීමට කැමැත්තක් දක්වන සහ තවදුරටත් ආයෝජන අවස්ථා වැඩිකර ගැනීමට කැමති, මෙහි සඳහන් කොන්දේසි හා අධිකාරියේ නීතිරීති පිළිපැදීමට එකඟවන ඕනෑම ආයෝජකයෙකුට සාමාන්‍ය සේවා (ලංසු ආරාධනා 02) සඳහා අයදුම් කල හැකිය. දක්ෂිණ අධිවේගී මාර්ගය හරහා සුඛෝපභෝගී බලපත්‍ර සඳහා (ලංසු ආරාධනා 01) අයදුම් කල හැක්කේ දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ බලපත්‍රලාභීන්ට පමණි. එසේ වුව ද මීට ප්‍රථම මෙම අධිකාරියෙන් ලංසු මගින් බලපත්‍ර අයදුම් කර තෝරා ගැනීමෙන් පසුව බලපත්‍ර ලබා ගැනීමට කටයුතු නොකිරීම නිසා අසාධු ලේඛනයට නම ඇතුළත් වූ පුද්ගලයින්ට ලංසු ඉදිරිපත් කිරීමට හිමිකමක් නොමැත.

**2.2** ලංසු තැබීම මගින් බලපත්‍රයක් ලබා ගැනීමට ඉල්ලුම් කරන මාර්ගයේ කාලසටහනට අනුව පහසුවෙන් සේවා ආරම්භ කිරීමට හැකියාව තිබිය යුතුය. කාලසටහනට පටහැනිව සෙසු ධාවකයින්ගේ ආදායමට හානි වන පරිදි ධාවනය කිරීම 1996 අංක 02 දරණ දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ප්‍රඥප්තිය හා 2009 අංක 01 දරණ දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සංශෝධිත ප්‍රඥප්ති ප්‍රකාරව ලබාදෙන බලපත්‍රය අවලංගු කිරීමට හේතුවේ.

SAMPLE

**2.3** දක්වා ඇති සියලුම සේවා සඳහා බස්රථයක හිමිකම නොමැති ආයෝජකයෙක් බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා තෝරාගනු ලැබුවහොත් තෝරාගත් දිනයේ සිට බස්රථයක් යෙදවීමට උපරිම වශයෙන් මාස දෙකක (දින 60) කාලයක් ලබාදෙනු ඇත. අවසර දී ඇති කාලය තුල නියමිත ආසන ධාරිතාවයකින් යුත් බස්රථයක් ඉදිරිපත් කර, බලපත්‍රය ලබා ගත යුතු වන අතර එසේ නොකලහොත් ඔහුට හෝ ඇයට බලපත්‍රය නිකුත් කිරීමට ගනු ලැබූ තීරණය අවලංගු කර ඔහුගේ / ඇයගේ නම අසාදු ලේඛන ගත කෙරේ .

## 03. ලංසුකරුවන් ලංසු ඉදිරිපත් කිරීමේ සියලු කරුණු දැන සිටිය යුතු බව

**3.1** ලංසුකරුවන් ලංසු ලිපි ලේඛන/උපදෙස්/කොන්දේසි මැනවින් පරීක්ෂා කර බලා සියලුම කරුණු සම්බන්ධයෙන් පූර්ණ දැනුමක් ලබා ගත යුතුය.

**3.2** අධිකාරියේ නිලධාරියෙකු හෝ වෙනත් අයෙකු කරනු ලබන වාචික පැහැදිලි කිරීම් හෝ දෙනු ලබන තොරතුරු මත වැරදි වටහා ගැනීම් සම්බන්ධයෙන් මගී ප්‍රවාහන අධිකාරියේ නෛතික බැඳීමක් නොමැත.

## 04. ලංසු ඉදිරිපත් කිරීමේ කාලසීමාව

**4.1** ලංසු ලිපිලේඛණ නිකුත් කිරීම **2020/03/06** දින **0830** පැය සිට **2020/03/30** දින **1500** පැය දක්වා (කාර්යාල වේලාව තුල පමණි)

**4.2** ලංසු භාරගැනීමේ අවසාන දිනය හා වේලාව **2020/03/31** වේලාව **1130** පැයට

**4.3** ලංසු විවෘත කරන දිනය හා වේලාව **2020/03/31** වේලාව **1200** පැයට

## 05. ලංසු ඉදිරිපත් කිරීම

**5.1** සියලුම ලංසු ලිපිලේඛණ සභාපති, දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය, අංක 67, ලේන්බාන් විදිය, කොටුව, ගාල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ලංසු භාර ගන්නා අවසාන දින නියමිත වේලාවට පෙර ප්‍රධාන කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිම කල හැකිය.

**5.2** සෑම ලංසුකරුවෙක්ම තම අයදුම් පත්‍රය පිටපත් දෙකකින් යුක්තව සකස් කල යුතු අතර, එහි මුල් පිටපත හා අනු පිටපත වශයෙන් පිටපත් දෙකක් ලියුම් කවර දෙකක ඇතුළත් කර එම ලිපි කවරයේ වම් කෙලවරෙහි “ මුල් පිටපත “ හා “අනු පිටපත “ වශයෙන් සටහන් කර නැවත එම කවර දෙකම එක් ලියුම් කවරයක බහා ඉහත ලිපිනය වෙත එවිය යුතුය.

**5.3** ලංසු ලිපිලේඛණ ඉදිරිපත් කරන ලිපි කවරයේ වම් පස ලංසු යොමු අංකය හා ලංසුකරුගේ ලිපිනය පැහැදිලිව සඳහන් කර තිබිය යුතුය. (ලංසු යොමු අංකය, ලංසු සේවාව පිළිබඳ විස්තරවල ඇතුලත්ව ඇත)

SAMPLE

**5.4** ඒ ඒ මාර්ගවල බලපත්‍ර ලබා ගැනීමට ලංසු ඉදිරිපත් කිරීමේදී ආපසු ගෙවනු ලබන රු.50,000/- ඇප තැන්පත් මුදලක් ගෙවිය යුතුය. එම මුදල ලංසු ලේඛණයේ සඳහන් කර ඇත. ලංසු අයදුම් පත්‍ර ප්‍රධාන කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලන්නේ නම් එම කාර්යාලයට එම තැන්පත් මුදල ගෙවා රිසිට් පතක් ලබා ගත යුතුය.

**5.5** ලංසු ලිපිලේඛණ තැපෑලෙන් එවනු ලබන්නේ නම් අදාල තැන්පත් මුදල තමාට ආසන්න අධිකාරියේ ගාල්ල/මාතර/තංගල්ල දිස්ත්‍රික් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා කුවිතාන්සියේ ජායා පිටපතක් අයදුම් පත්‍රයේ මුල් පිටපතට අමුණා තිබිය යුතුය.

**5.6** ලංසු ලිපිලේඛණ වල සඳහන් කර ඇති ආපසු ගෙවනු ලබන තැන්පත් මුදල සඳහා චෙක්පත් ආදිය භාරගනු නොලැබේ. ප්‍රධාන කාර්යාලයට හෝ අධිකාරියේ දිස්ත්‍රික් කාර්යාලයයකට ඇප තැන්පත් මුදල් ගෙවා ඇති බව තහවුරු නොවන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**5.7** මීට පෙර මෙම අධිකාරිය ලංසු තැබිම සඳහා ආරාධනා කරන ලද මාර්ග බලපත්‍රයකට අදාලව මිල ගණන් ඉදිරිපත් කර ලංසු ප්‍රදානය කිරිමෙන් පසු ලංසු ප්‍රදානය භාර ගැනීමට ඉදිරිපත් නොවූ ආයෝජකයෙකු විසින් මෙම ලංසු ප්‍රදානය කිරිමට අදාල අයදුම් පත්‍රය ඉදිරිපත් කරයි නම් එය ප්‍රතික්ෂේප කිරීමට අධිකාරියට බලය ඇත.

**5.8** ප්‍රමාදවී ලැබෙන ලංසු අයදුම් පත්‍ර පිළිගනු නොලැබේ. එවැනි අයදුම් පත්‍ර විවෘත නොකරන අතර, ලංසු විවෘත කල දින සිට සතියක් ඇතුළත එම අයදුම් පත්‍ර ලංසුකරුවන්ට නැවත ආපසු ලබාගත හැකිය.

## 06. සාමාන්‍ය සේවා වාර්ෂික බලපත්‍ර සඳහා ලංසු ඉදිරිපත් කිරීමට අදාල කොන්දේසි

**6.1** දකුණු පළාතේ පොරොත්තු ධාවනය සඳහා නිත්‍ය මගී සේවා අවසර පත්‍රලාභි බස්රථ හිමිකරුවෙකුට හෝ හිමිකාරියකට මෙම මාර්ග ඉල්ලුම් කර ලංසු තැබීම මගින් බලපත්‍රය ලබාගත හොත් 20% ක වට්ටම් ප්‍රතිශතයක් හිමිවේ. තවද මෙහි සාමාන්‍ය සේවා වාර්ෂික මගී ප්‍රවාහන බලපත්‍රය ලබාගත් හිමිකරුගේ හෝ හිමිකාරියගේ පොරොත්තු බලපත්‍රය අවලංගු කෙරේ.

## 07. දක්ෂිණ අධිවේගී මාර්ගය හරහා සුඛෝපබෝගී වාර්ෂික බලපත්‍ර සඳහා ලංසු ඉදිරිපත් කිරීමට අදාළ කොන්දේසි.

**7.1** ලංසු කැඳවන මාර්ගයේ නියමිත අන්තයන් දෙකම සහිතව එම මාර්ගය ඔස්සේ සම්පූර්ණයෙන් ධාවනය වන හෝ අන්තයන් දෙකම සහිතව මාර්ග කොටසක් ආවරණය වන පරිදි ධාවනය වන බස් සේවාවක දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ බලපත්‍රලාභී කාලසටහන් සහිත හෝ පොරොත්තු ධාවකයන් අතරින් අධිකාරිය නියම කර ඇති අවම ලංසු වටිනාකම ඉක්මවා ඉහලම මිල ගණන් ඉදිරිපත් කර ඇති ධාවකයා වෙත සෙසු ටෙන්ඩර් වටිනාකම් නොසලකා ලංසු කැඳවන මාර්ගයේ බලපත්‍ර හිමිකම ලබාගත හැක. මෙහිදි පවතින මාර්ග බලපත්‍රය අවලංගු කරනු ලැබේ. තවද

මෙම හිමිකම ලබාගැනීම සඳහා අවලංගු කල යුතු මාර්ග බලපත්‍රයට සම්බන්ධ විස්තර, ලංසු අයදුම් පත්‍රයේ අංක 6 යටතේ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.(බලපත්‍රය අවලංගු නොකිරිමේ ක්‍රමවේදය යටතේ වුවද අවශ්‍ය වේ නම් අනෙකුත් කොන්දේසිවලට යටත්ව එම සේවාවන්හි ධාවකයින්ට ලංසු ඉදිරිපත් කල හැක)

**7.2** ලංසු කැඳවන මාර්ගයේ තම සේවාවෙන් 75% හෝ ඊට වැඩි ප්‍රමාණයක් ධාවනය වන්නේ නම් අදාළ ධාවකයාට මෙම සේවාව සඳහා අයදුම් කරන අවස්ථාවක 20% ක වට්ටම් ප්‍රතිශතයක් හිමි වේ. මෙහිදී පවතින මාර්ග බලපත්‍රය **අහෝසි වීමක් සිදු නොවේ.**

**7.3** ඉහත අංක 7.2 කරුණට අදාළ නොවන දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ අනෙකුත් බලපත්‍රලාභී සියළුම පොරොත්තු ධාවකයන් සඳහා 20% වට්ටමක් හිමි වේ.මෙහිදී පවතින මාර්ග බලපත්‍රය **අහෝසි වීමක් සිදු වේ.**

**7.4** වට්ටම් ප්‍රතිශතය යටතේ ලැබෙන ප්‍රතිලාභය ලබා ගැනිමේදි සෑම විටම වට්ටම් ප්‍රතිශතය යටතේ ගණනය වූ වටිනාකම අවම ලංසු වටිනාකම ඉක්මවා පැවතිය යුතුය. එයට වඩා අඩුවන අවස්ථාවලදී අවම ලංසු මුදලට අදාල බලපත්‍රය ඉල්ලුම්කරු වෙත පිරිනමනු ලැබේ.

**7.5** ඉහත සඳහන් වට්ටම් ප්‍රතිශත වලින් ලංසු කැඳවන එක් මාර්ග බලපත්‍රක් සඳහා ඉල්ලුම් කල හැක්කේ එක් වට්ටම් ක්‍රමවේදයකට අනුව පමණි. (ලංසු කැඳවන එක් මාර්ග බලපත්‍රක් සඳහා වට්ටම් ප්‍රතිශත දෙකක් එකවර ලබා ගත නොහැක)

**7.6** ආයෝජන ප්‍රතිලාභ අවධානම් කාල සීමාව සලකා බලා මෙම වාර්ෂික බලපත්‍රය ලබා ගත් ධාවකයාට ඔහුගේ බලපත්‍රය ලබා ගත් ලංසු වටිනාකම මත පදනම් ව නැවත එය ආසන්න එක් එක් වර්ෂයේ ලංසු වටිනාකම් ලෙස තක්සේරු කොට වසර 5 ක් දක්වා එම බලපත්‍රය වාර්ෂිකව ලබා ගත හැක. මෙහිදී වාර්ෂිකව සේවාව සාර්ථක ලෙස පවත්වා ගෙන ගොස් තිබිය යුතුය.

**7.7** වසර පහකට වරක් අධිකාරිය විසින් වාර්ෂික අවම ලංසු වටිනාකම් පිළිගත් විද්‍යාත්මක පදනමක් යටතේ නැවත තක්සේරු කරන අතර මුල් ආයෝජකයාගේ ආයෝජන අවස්ථා තහවුරු කරමින් ඔහුගේ පළමු ලංසු වටිනාකම හා අධිකාරිය නැවත තක්සේරු කරන ලද අවම ලංසු වටිනාකම යන දෙක අතුරින් වැඩිම වටිනාකම යටතේ නැවත ඔහු වෙත හෝ ඇයට එම වාර්ෂික බලපත්‍රය ලබා ගත හැක. ඒ සඳහා පළමු බලපත්‍රධාරියා කටයුතු නොකරන්නේ නම් නැවත ප්‍රසිද්ධ ලංසු කැඳවීමකට අධිකාරිය කටයුතු කරනු ලැබේ.

**7.8** මෙම බලපත්‍ර පළමු වසර පහක කාලයක් තුල කිසිදු හේතුවක් මත එහි බලපත්‍ර අයිතිය පැවරීම සඳහා සලකා බලනු නොලැබේ.

SAMPLE

**08.** අධිකාරියේ නිත්‍ය මගී ප්‍රවාහන බලපත්‍රයක් ලබා නොගෙන ලංසු තැබීම සඳහා ආරාධනා කර ඇති සාමාන්‍ය සේවා මාර්ගයකට අදාලව මාස 06 කට වැඩි කාලයක් ලොරි රථ, ට්‍රක් රථ හෝ වෑන් රථ යටතේ මගී ප්‍රවාහනයේ යෙදී ඇති ධාවකයෙකුට ලංසු ප්‍රදානය කරන්නේ නම් ඔහු හෝ ඇය පහත අවශ්‍යතා සපුරා ඇති අවස්ථාවන් හි ඔහුගේ ලංසු වටිනාකමින් 20% ක වට්ටමක් ලබා දෙනු ලැබේ.

**8.1** ආසන්නම මාස 6 ක කාලයක් තුල අධිකාරියේ බලපත්‍රයකින් තොරව ලංසු සඳහා ආරාධනා කර ඇති මාර්ගයෙහි අධිකාරිය දක්වා ඇති රථ වාහන (ලොරි රථ, ට්‍රක් රථ, වෑන් රථ) යටතේ මගී ප්‍රවාහන කටයුතු වල යෙදුන බවට අධිකාරියේ දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ තැන විසින් සහතිකයක් ලබාදී තිබීම සහ, ආසන්න මාස 6 ක කාලයක් පුරාවට අදාල මාර්ගයේ මගී ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීමට දායක වූ බවට ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිතැන සහ විහාරාධිපති ස්වාමීන්වහන්සේ/පොලිසිය හෝ පූජකතුමන්ලා යන කුමන හෝ පාර්ශවයකින් සහතික කර තිබීම අත්‍යවශ්‍ය වේ.

**8.2** තවදුරටත් අදාල මාර්ගයෙහි අනවසරයෙන් ධාවනයේ නොයෙදෙන බවට අධිකාරිය වෙත ලිඛිතව සහතික විය යුතුය. (බලපත්‍රය නිකුත් කිරීමට ප්‍රථම මෙම ලිපිය ඉදිරිපත් කල යුතුය)

## 09. ලංසු අයදුම්පත්‍ර සංශෝධනය හා ඉවත් කර ගැනීම (විරෝධතා දැක්වීම)

ලංසු අයදුම් පත්‍ර භාර ගැනීමට නියමිත අවසාන දිනයෙහි පෙ.ව 11.00 ට ප්‍රථමයෙන් සංශෝධන හෝ ඉවත් කර ගැනීම පිළිබඳ ලංසු භාර ගනු ලබන ප්‍රධාන කාර්යාලයේ ප්‍රසම්පාදන මණ්ඩලයේ සභාපති වෙත ඉදිරිපත් කල හොත් ඒ පිළිබඳ ඉඩකඩ ලබාදෙනු ඇත. එවැනි ඉල්ලීම් වලට වන ප්‍රමාදයන් හේතුවෙන් සංශෝධන හා ඉවත් කර ගැනීම් වලට අදාළ විරෝධතා සම්බන්ධයෙන් නිසි කටයුතු සිදු නොවීම පිළිබඳ අධිකාරිය වගකියනු නොලැබේ. ලංසු ඉදිරිපත් කිරිම සම්බන්ධ විරෝධතා ඉදිරිපත් කිරීමට ඇතොත් ලංසු විවෘත කිරීමට පැය ½ කට පෙර එවැනි විරෝධතා ප්‍රසම්පාදන මණ්ඩලයේ සභාපති වෙත දැන්විය යුතුය. පසුව ඉදිරිපත් කෙරෙන විරෝධතා පිළිගනු නොලැබේ.

## 10. ලංසු අයදුම්පත්‍රය පැහැදිලිව හා නිවැරදිව සම්පූර්ණ කල යුතු බව

**10.1** ලංසු අයදුම්පත්‍රය පැහැදිලිව හා නිවැරදිව සම්පූර්ණ කිරීම අත්‍යවශ්‍යය. ලංසුව ඉදිරිපත් කරන මුදල අකුරෙන් හා ඉලක්කමෙන් නියමිත පේලියේ පැහැදිලිව සඳහන් කල යුතු අතර කපාහැරීම් හෝ වෙනස් කිරීම් කර ඇත්නම් එහි කෙටි අත්සන් යෙදිය යුතුය.

**10.2** සේවා කීපයකට ඉල්ලුම් කරන්නේ නම් ඒ සඳහා වෙන වෙනම ලංසු අයදුම් පත්‍ර ඉදිරිපත් කල යුතු අතර ඇප මුදල් තැන්පත් කල යුතුය.

## 11. ලංසු විවෘත කිරීම.

**11.1** ලංසු විවෘත කරන දිනය හා වේලාව ලංසු සඳහා ආරාධනා පත්‍රිකාවේ සඳහන් වේ. ගාල්ල ප්‍රධාන කාර්යාලයේදී ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරන දිනයේ ලංසුකරු වෙනුවට ඔහුගේ නියෝජිතයෙකු ඉදිරිපත් වන්නේ නම් ඒ සඳහා ලංසුකරුගේ අනුමැතිය සහිතව ලිපියක් ඉදිරිපත් කල යුතුය.

SAMPLE

**11.2** ලංසුකරුවන්ගේ නම් හා ඔවුන් සටහන් කර ඇති මුදල පමණක් සහභාගී වන ලංසුකරුවන් ඉදිරියේ ප්‍රකාශ කරනු ලැබේ. ලංසු විවෘත කරන දින සහභාගී නොවන ලංසුකරුවන්ගේ ලංසු අයදුම්පත්‍ර විවෘත කරනු නොලැබේ. ( ලංසුකරුගේ බලය පවරන ලද නියෝජිතයෙකු සහභාගී නොවන අවස්ථාවකදී ) ලංසුකරුගේ නියෝජිතයා විවෘත කරන දිනට සහභාගී වන විට ඒ සඳහා අමුණා ඇති පෝරමය නිවැරදිව පුරවා ලංසු විවෘත කරන දිනයේ ලංසු විවෘත කිරීමට නියමිත වේලාවට පැය ½ කට පෙර ගාල්ල, කොටුව, ලේන්බාන් වීදියේ , නො.67 හි දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ප්‍රධාන කාර්යාලයට භාරදිය යුතුය.

**11.3** විවෘත නොකරන ලද ලංසු ලිපි,ලේඛන ගත කරන අතර ලංසු විවෘත කල දින සිට සතියක් ඇතුළත කාර්යාලිය දිනයකදී ඉල්ලුම්කරුවන්ට ඒවා ආපසු ලබාගත හැකිය.

**12.** ලංසුව විවෘත කිරීමේ දිනයේදීම ලංසුව පිරිනැමීමට සුදුසුකම් ලැබූ ලංසුකරු වෙත පිරිනැමීමේ ලිපි නිකුත් කරන අතර එදිනට ලංසුව භාර ගැනීම සඳහා ලංසුකරු ලංසු මුදලින් 10% ක් අධිකාරියට ගෙවා ලදු පතක් ලබා ගත යුතුය. එසේ මුදල් ගෙවීම් කර නොමැති නම් ලංසුව පිරිනැමීම අවලංගු වන අතර එම ලංසුකරුගේ නම අසාධු ලේඛනයට ඇතුළත් කරනු ඇත.

SAMPLE

**13.** ඉහත අංක 12 යටතේ ලංසු පිරිනැමීම අවංලගු වන අවස්ථාවක එම බස් සේවාවේ 2 වන ඉල්ලුම්කරුට පළමු ඉල්ලුම්කරුගේ ලංසු මිලට ලංසුව පිරිනැමිය හැක.

**13.1** ලංසු ප්‍රදානයෙන් පසු ලංසුකරු මාස 2 (දින 60) ක් ඇතුලත ඒ සඳහා බලපත්‍ර ලබාගත යුතුය. මාස 2 (දින 60) ක් ඇතුළත බලපත්‍රය ලබා නොගැනීම හෝ බලපත්‍රය ලබා ගැනීමට ක්‍රියා නොකිරීම ලංසු ප්‍රදානය අවලංගු වීමට හේතු වේ. එහිදි ලංසු ප්‍රධානය කිරීමේදි අයකරනු ලැබූ 10% ක මුදල, ඇප තැන්පතු මුදල හා ලංසුවට අදාලව යම්කිසි මුදලක් ගෙවා ඇත්නම් එම සියලු මුදල්ද අහිමි කරනු ලැබේ.

**13.2** පවතින මාර්ග බලපත්‍රය අහෝසි කිරීමක් යටතේ ලංසු ප්‍රධානය කර ඇති අවස්ථාවක නව මාර්ග බලපත්‍රය නිකුත් කරන අවස්ථාවේදි පවතින මාර්ග බලපත්‍රය අහෝසි කිරීම සිදු වේ.

**13.3** නොවැලැක්විය හැකි හේතුවක් මත අදාළ ලංසු විවෘත නොකරන අවස්ථාවකදී සහ ලංසු ඉදිරිපත් කොට සුදුසුකම් නොලැබූ අයදුම්කරුවන්ගේ ඇප තැන්පතු මුදල් දින 14 ක් තුල නිදහස් කරනු ලැබේ.

## 14. ලංසු අයදුම් පත්‍ර අවලංගු වීම හෝ ප්‍රතික්ෂේප කිරීම

පහත කරුණු මත ලංසු ඉල්ලුම්පත්‍ර අවලංගු විම හෝ ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**14.1** අයදුම් පත්‍ර පැහැදිලිව සම්පූර්ණ නොකිරීම.

**14.2** ලංසු අයදුම්පත්‍රය ප්‍රමාදවී අධිකාරිය වෙත ලැබීම

**14.3** ලංසු තැබිම සඳහා නම් කරනු ලබන මාර්ගය හදිසියේ පාලනය කල නොහැකි හේතු මත ධාවනයට නුසුදුසු හෝ ධාවනය කිරීම පිළිබඳ වෙනත් ගැටලු පැන නැගීම.

**14.4** නියමිත ඇප තැන්පත් මුදල නොගෙවීම හෝ ගෙවූ බවට තහවුරු නොවීම

14.5 ඉහත **11.1** වගන්තිය යටතේ ලංසු විවෘත කරන අවස්ථාවට ලංසුකරු හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයෙකු සහභාගී නොවීම

## 15. ලංසු පිළිබඳ අධිකාරිය වගකීමෙන් නිදහස් වීම

15.1 මෙම ලංසු තැබීම මගී ප්‍රවාහන බලපත්‍රයක් නිකුත් කිරීමට තෝරා ගැනීම සඳහා පමණක් බැවින්, ඒ අනුව අධිකාරිය විසින් ලංසු තබන ලද සේවාවක් සඳහා බලපත්‍රයක් නිකුත් කල වහාම ලංසු තැබීමට අදාල සියලු කොන්දේසි හා වගකීම් වලින් අධිකාරිය නිදහස් වේ.

15.2 ලංසු තැබීම මගින් බලපත්‍රයක් ලබා ගැනීම, අනෙකුත් බලපත්‍රධාරින්ට වඩා අධිකාරියේ විශේෂ වාසි ලබා ගැනීමට හිමිකමක් නොවේ.

15.3 රජයේ තීරණ, ධාවනයට ඇතිවන බාධා, අධිකාරියට පාලනය කල නොහැකි හේතුන් මත ලංසු තැබීම සඳහා ආරාධනය කරන ලද මාර්ගයකට බලපත්‍ර ලබාදීමට නොහැකි වීම මත කිසියම් මාර්ගයක ලංසුවක් පිලිගැනීමට හෝ නොගැනීමට අධිකාරියට සිදුවිය හැකිය. එවැනි අවස්ථාවක ලංසු ලිපිනොනැගීම සම්බන්ධ අධිකාරිය වගකිමෙන් නිදහස් වේ.

15.4 ලංසු සඳහා ආරාධනය කරනු ලබන මාර්ග, කාලසටහන් හා බස්නැවතුම්පොල පහසුකම් විශේෂ හේතුන් මත සංශෝධනයට අධිකාරියට බලය ඇත.

15.5 වැඩිම මිල ගණන් සඳහන් ලංසුව හෝ ඕනැම ලංසුවක් පිළිගැනීමට අධිකාරිය බැඳි නැත.

## 16. ඇප තැන්පත් මුදල් ආපසු ගෙවීම

16.1 ලංසු විවෘත කල දින සිට දින **14** ක් ඇතුලත ලංසු පිරිනැමීමට සුදුසුකම් ලැබු ලංසුකරු හා මෙම කොන්දේසි අනුව වගකීමට යටත් වන ලංසුකරුවන් හැර අනෙකුත් ලංසුකරුවන්ගේ ඇප තැන්පතු මුදල් ආපසු ලබාගත හැකි අතර ලංසු පිලිගැනීම මගින් බලපත්‍ර ලබාගැනීමට සුදුසුකම් ලැබු ලංසුකරුවන්ගේ ඇප තැන්පත් මුදල් අධිකාරියට ගෙවිය යුතු ලංසු මුදලින් කොටසක් ලෙස හිලව් කරන අතර ඒ සඳහා ඇප තැන්පතු කුවිතාන්සියේ මුල් පිටපත අධිකාරියට ලබාදිය යුතුවේ.

ක්‍රිෂාලි මුතුකුමාරණ
සභාපති,
දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය,
ගාල්ල.
**2020/03/05**